Good Food, Good Life

Nestlé Lanka PLC News Release
Colombo: 10 October 2016

# ලෝක ළමා දිනයේදී පාපැදි දහසක් *Milo* පාපැදි සවාරියේ යෙදෙමින් කොළඹ නගරය හරිත පැහැයෙන් වර්ණවත් කරයි

*සෞඛ්‍ය සම්පන්න උදෑසන ආහාර වේලක් සහ ක්‍රියාශීලී ජීවන රටාවක් සඳහා ළමයින් උනන්දු කෙරේ*

ජනප්‍රිය 'Mom, Me and My *Milo*' ප්‍රවර්ධන ව්‍යාපෘතියෙහි පරිසමාප්ති උළෙළ සමග සම්බන්ධවෙමින් 1,000කට අධික ළමයින් සහ ඔවුන්ගේ පවුල් පසුගියදා ලෝක ළමා දිනය සැමරූහ. මීට සමගාමීව පැවැත්වුණු අති දැවැන්ත *Milo* පාපැදි සවාරිය නිසා කොළඹ නගරයේ වීදි හරිත වර්ණයෙන් බැබළිණි.

යහපත් පෝෂණයක් සහ ක්‍රියාශීලී ජීවන රටාවක් පිළිබඳව නිරන්තරවම දැනුවත්භාවය ලබාදෙන සන්නාමයක් වන *Milo,* මෙහිදී ඉලක්ක කරනු ලබන්නේ ක්‍රියාශීලීව සිටීම විනෝදජනක දෙයක්ද බව ළමුන්ට පෙන්වා දීමයි. 'Mom, Me and My *Milo*' ප්‍රවර්ධන ව්‍යාපෘතිය බොහෝ ළමුන් සිය විවේකී අවස්ථාවන්හිදී කරන ක්‍රියාකාරකමක් වන පාපැදි පැදීම තුළින් ළමයින්ටත්, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත්, සෞඛ්‍ය සම්පන්න දිවියක් ගත කිරීමට අනුබල ලබා දුන්නේය.

සිත්ගන්නා සුළු ලෙස සන්නාමකරණය කරන ලද *Milo* පාපැදි 1,000 සමග තවත් දහස් ගණනක් සහභාගීවූ මෙම පාපැදි සවාරිය, ක්‍රීඩා අමාත්‍යාංශ ක්‍රීඩාංගණයෙන් ආරම්භ වූ අතර සුන්දර කොළඹ නගරයේ වීදි හරහා සංචාරය කරන ලදී. වීදි සංචාරයෙන් පසුව පාපැදි සවාරිය නැවත ආරම්භක ස්ථානයට පැමිණි පසු දැවැන්ත විනෝදාත්මක සැණකෙළියක් ආරම්භ විය.

''මව්වරුන්ගේ අනුබලය ඇතිව ළමුන් බාහිර ක්‍රියාකාරකම්වලට දැඩි කැමැත්තෙන් සහභාගීවනවා දකින්නට ලැබීම ඉතාමත් සතුටු ජනකයි. ළමුන් මේ සඳහා උනන්දුවෙන් සහභාගීවීම, ක්‍රියාශීලී ජීවන රටාවකට කැමති දරුවන් සහ ළමුන්ට හොඳම පෝෂණයක් ලබා දීම සඳහා උත්සුක වන අභිමානවත් මව්වරුන් සමග *Milo* පවත්වාගෙන යන දැඩි සම්බන්ධතාවයේ සාර්ථකත්වය පෙන්නුම් කරන්නකි. *Milo* පාපැදි සවාරියට නැවතත් ඉහළ සාර්ථකත්වයක් ලැබීම ගැන අපි ඉතා සතුටට පත්වන අතර, ක්‍රියාශීලී ජීවන රටාවකට අනුබලය ලබා දෙමින් ('fuelling the winning spirit') ඉදිරියටත් පවත්වාගෙන යාමට අපි බලාපොරොත්තු වෙනවා.'' යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ නියෝජ්‍ය උප සභාපති - නෝමන් කන්නන්ගර මහතා සිය අදහස් දැක්වීය.

මෙම අවස්ථාව ළමුන්ට මවුවරුන් සමග ඇති බැඳීම සවිමත් කරගැනීමට ඉඩ ලබා දුන් අතර ක්‍රීඩා සහ වෙනත් ක්‍රියාකාරකම් හරහා සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් පවත්වා ගැනීමේ වැදගත්කමද ඔවුන්ට අවබෝධ කරදෙන ලදී. මෙම වැඩසටහනේදී සංවිධානය කර තිබූ 'Nestlé Nutri-Corners' හරහා නොමිලේ පෝෂණ දැනුම ලබා දුන් අතර ළමුන්ට සහ ඔවුන්ගේ දෙමාපියන්ට උදෑසන ආහාර වේලෙහි වැදගත්කම කියා දෙමින්, සෑම දිනකම සෞඛ්‍ය සම්පන්න උදෑසන ආහාර වේලක් ලබාගන්නා බවට ඔවුන්ගෙන් ප්‍රතිඥාවක් ලබා ගැනීමද මෙහිදී සිදු විය.

''*Milo* සෑම විටම ක්‍රියාශීලී ජීවන රටාවක් සඳහා ළමයින් තුළ උනන්දුවක් ඇති කරන්නට කටයුතු කර තිබෙනවා. අපි දශක දෙකකට වැඩි කාලයක සිට ශ්‍රී ලංකාවේ පාසල් ක්‍රීඩාවන් සඳහා විශාල සහයෝගයක් ලබා දී ඇති අතර ඒ හරහා සෑම වසරකම දහස් ගණනක් මලල ක්‍රීඩකයින් සවිබලගන්වමින් ඔවුන්ගේ හැකියාවන් උපරිම තලයට රැගෙන ඒමට හැකිවීම ගැන ආඩම්බර වෙනවා. රට පුරාම ළමුන් පාපැදි ධාවනයට උනන්දු කරවීමට *Milo* කටයුතු කරන්නේ එයින් ඔවුන්ගේ ශක්තිය හා සවිබලය වර්ධනය වීමට උපකාරී වන බැවින් හා පරිපූර්ණ පෞරුෂයක් හිමිකර ගැනීමට හැකියාව ලැබෙන නිසයි. මෙය ළමුන්ගේ ශාරීරික ක්‍රියාකාරීත්වය ඉහළ නැංවීම සඳහා නෙස්ලේ සිදුකරන බොහෝ ක්‍රියාකාරකම්වලින් තවත් එක් අංගයක්.'' යනුවෙන් නෙස්ලේ ලංකා සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා ශිවානි හෙග්ඩේ මහත්මිය සිය අදහස් දැක්වූවාය.

'Mom, Me and My *Milo*' ප්‍රවර්ධන ව්‍යාපෘතිය මෙවර සංවිධානය කරන ලද්දේ දෙවැනි වරටයි. *Milo* පැකට්ටුවක් අතේ තබා ගෙන සිය මවත් සමග ගනු ලැබූ සෙල්ෆි ඡායාරූපයක් එවීමෙන් මේ සඳහා සහභාගී වීමට ඔවුන්ට අවස්ථාව ලැබුණු අතර දිනුම් ඇදීමක් හරහා තෝරාගත් වාසනාවන්ත ජයග්‍රාහකයින් 1,000 ක් හට *Milo* පාපැදි පිරිනමන ලදී. මේ සඳහා ඉතාමත් ඉහළ පාරිභෝගික ප්‍රතිචාර ලැබුණු අතර *Milo* සන්නාමය කෙරෙහි පාරිභෝගිකයින් දක්වන බැඳීම සහ විශ්වාසය එයින් මනාව පැහැදිලි වෙයි.

ශ්‍රී ලංකාව පුරා පැතිරී සිටින කිරි ගොවීන් 20,000කට ආසන්න සංඛ්‍යාවකගෙන් දෛනිකව මිලදී ගන්නා දේශීය නැවුම් කිරි යහගුණය යොදා නිපදවන *Milo*, 'බී' විටමින් සහ යකඩ පෝෂණයෙන් පරිපූර්ණය. ලොව පුරාම කීර්තිය දිනා ගෙන සිටින නෙස්ලේ සමාගමේ තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූලව *Milo* නිපදවනු ලබන්නේ කුරුණෑගල පිහිටි නෙස්ලේ ලංකා සමාගමේ අති නවීන පහසුකම් සපිරි කර්මාන්තශාලාවේදීය.